※ මෙම ලිපිය YYYY / MM / DD වන දින අප සේවාවන් ලබන පාරිභෝගිකයින් වෙත යවා ඇත. ඔබ දැනටමත් අප බැංකුවේ ගිණුම් අවලංගු කොට ඇත්නම්, මෙම ලිපියට ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය නොවේ.

YYYY / MM / DD දින

Japan Post Bank, Co., Ltd.

# ගනුදෙනු වල අරමුණු යනාදිය තහවුරු කර ගැනීම සඳහා වූ ඉල්ලීමයි

පාරිභෝගික ඔබගේ සාර්ථකත්වය අපගේ ප්‍රාර්ථනාවයි!

ඔබ නිතරම තැපැල් බැංකුව සහ තැපැල් කාර්යාලය භාවිතා කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙමු.

මෑත වසරවල දී අන්තර්ජාතික ප්‍රජාව තුල, මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා අරමුදල් ලබා දීම වැළැක්වීමේ පියවරවල වැදගත්කම වැඩි වෙමින් පවතී. එබැවින්, ජපානය තුල ඇති එක් එක් මූල්‍ය ආයතන විසින් අදාළ අමාත්‍යාංශ ආදිය සමඟ සම්බන්ධ වී, විවිධ ක්‍රියාමාර්ග ගනිමින් ශක්තිමත් මූල්‍ය පද්ධතියක් පවත්වා ගෙන යාමට උත්සාහ කරනු ලබයි. ඉන් එක් ක්‍රියාමාර්ගයක් ලෙස, අප බැංකුවේ ද, නව ගිණුමක් ආරම්භ කරන පාරිභෝගිකයින්ට අමතරව දැනටමත් ගිණුම් පවත්වා ගෙන යන පාරිභෝගිකයින් සඳහා ද, මෙම ලිපියට අමතරව, කවුන්ටරයේ දී ඔබෙන් විමසීම ආදිය මගින්, පාරිභෝගික භවතාගේ තොරතුරු සහ ගනුදෙනුවේ අරමුණු යනාදිය වරින් වර අඛණ්ඩව පරීක්‍ෂා කිරීම සිදු කරනු ලබයි.

එබැවින්, ඔබේ පහත සඳහන් ගිණුමට අදාළව මෙවැනි තොරතුරු පරික්ෂා කිරීමට අවශ්‍ය බැවින්, පහත සඳහන් ක්‍රම මගින් පිළිතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු. ඒ සඳහා ඔබට සිදු වන අපහසුතාවට කනගාටු වන්නෙමු.

| | |
|---|---|
| අදාළ ගිණුමේ සංකේත අංකය<br>(සාමාන්‍ය (ඉතුරුම්) තැන්පතු<br>හෝ මුදල් හුවමාරු ගිණුම) | ＊＊＊＊＊－＊＊＊＊○○○○<br>（අවසාන ඉලක්කම් 4 පමණක් සඳහන් කෙරේ） |
| ප්‍රතිචාර කාලසීමාව | YYYY / MM / DD දින |

අප බැංකුව මගින් ඔබගේ වටිනා වත්කම් ඉදිරියටත් නොකඩවා භාර ගන්නා අතර, ඔබ අප සමඟ සුරක්ෂිතව හා ආරක්ෂිතව ගනුදෙනු සිදු කර ගෙන යනු ඇතැයි බලාපොරොත්තු වෙමු. මෙය ඒ සඳහා කෙරෙන වැදගත් පියවරක් වන බැවින් ඔබ දක්වන සහයෝගය ඉහලින් අගය කරන්නෙමු.

තවද, ඔබ ලබා දෙන පිළිතුරු සම්බන්ධයෙන් පසු දිනක විමසීම් සිදු කල හැක. ඒ බව කල් ඇතුව දැනුවත් වන්න.

ස්තුතියි

පිළිතුරු සපයන ආකාරය----------------------------------------------------------------------------------------------------

ස්මාර්ට් ජංගම දුරකතනයක් හෝ පරිගණකයක් මගින්, අප බැංකු වෙබ් අඩවිය (පහත කොටස) → "පාරිභෝගික තොරතුරු ලබාදීම යනාදිය සඳහා කෙරෙන ඉල්ලීම" පිටුවෙහි※ සඳහන් ලින්ක් එක මගින් "තැපැල් බැංකුව, පාරිභෝගික තොරතුරු ලබාදෙන වෙබ් අඩවිය" වෙත පිවිස, එක් එක් ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න.

පිවිසීම සඳහා අවශ්‍ය ID එක සහ මුරපදය පහත පරිදි වේ.

(දකුණු පස ඇති ද්විමාන කේතය ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනය මගින් කියවීමෙන්, ඔබගේ ID එක සහ මුරපදය ඇතුළත් නොකරම ඇතුළු විය හැක.)

[ID]　　************

[මුරපදය] ************

※ (URL) https://www.jp-bank.japanpost.jp/honnin/hn_zct.html

（තොරතුරුවල ආරක්ෂාව සඳහා, ඇතැම් විස්තර ගුප්තකේතනය (එන්ක්‍රිප්ට්) කර ඇත.）

※ඔබට ස්මාර්ට් ජංගම දුරකතනයක් වැනි දෑ නොමැති නම් හෝ වෙනත් හේතුවක් මත ස්මාර්ට් ජංගම දුරකතනයක් වැනි දෑ මගින් පිළිතුරු සැපයීමට අපහසු නම්, පිළිතුරු සැපයීමේ ලේඛන තැපෑලෙන් එවන බැවින් කරුණාකර පහත සඳහන් විමසීම් මධ්‍යස්ථානය වෙත අමතන ලෙසට ඉල්ලා සිටිමු.

◇ නව ගනුදෙනු ආරම්භ කරන පාරිභෝගික භවතුන්ගෙන් විමසන තොරතුරු වලට සමාන තොරතුරු මෙහි දී තහවුරු කෙරේ.

◇ විමසන තොරතුරු අතර, ඔබගේ "සේවා ස්ථානය / ඉගෙනීම ලබන පාසල ආදිය" හා "වාර්ෂික ආදායම යනාදිය" ට සම්බන්ධ කරුණු ද ඇති අතර , ඔබට ගැටලුවක් නොවන පරාසයෙන් පිළිතුරු ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු.

◇ ජපන් භාෂාව හැර වෙනත් භාෂාවලින් තොරතුරු ලබා ගැනීම සඳහා, අප බැංකු වෙබ් අඩවිය (ඉහත URL) වෙත පිවිසෙන්න.

| | |
|---|---|
| විමසීම | තැපැල් බැංකු සමාගම,<br>පාරිභෝගික තොරතුරු කළමනාකරණ මධ්‍යස්ථානය<br>දුරකථන 0120-340-004<br>＜ විවෘත වේලාව＞ සතියේ දින 9:00 ～ 19:00<br>සෙනසුරාදා, ඉරිදා සහ නිවාඩු දින 9:00 ～ 17:00<br>(දෙසැම්බර් 31 වන දා සිට ජනවාරි 3 වන දා තෙක් භාවිතා කල නොහැක) |